www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානාපොලිස් ජීඑම් කම්කරුවන්ට සහයෝගය දෙනු !

## Support the Indianapolis GM workers!

ආන්ද්‍රෙ ඩීමන් විසිනි
2010 සැප්තැම්බර් 22

ඉන්දියානාපොලිස්හි ජෙනරල් මෝටර්ස් (ජීඑම්) මුද්‍රා අංශ ක්‍රියාකාරී කමිටුවේ කම්කරුවන්ට සහෝදරත්වය සහ සහයෝගය පලකරමින් ලිපි යවන ලෙස ලෝක සමාජවාදී වෙබ් අඩවිය ඉල්ලා සිටී. ජීඑම් සමාගම සහ සංගත කොල්ලකාර ජේඩී නෝර්මන් වෙනුවෙන් එක්සත් මෝටර් කම්කරු සමිතිය (යූඒඩබ්ලිව්) මගින් ඉල්ලා සිටිනු ලබන සියයට 50ක වැටුප් කප්පාදුවට එරෙහි සටනකට නායකත්වය දීම සඳහා කම්හලේ කම්කරුවෝ මෑතක දී මෙම කමිටුව ගොඩ නගා ගත්හ.

සමස්ත ආර්ථිකය පුරා කෲර වැටුප් කප්පාදුවක් ක්‍රියාවට දැමීම ආරම්භ කිරීමට ඔබාමා පරිපාලනය ජීඑම් සහ ක්‍රයිස්ලර් සමාගම්වල බංකොලොත්භාවය භාවිතා කිරීමෙන් වසරක් ගිය තැන ඉන්දියානාපොලිස්හි කම්කරුවෝ යූඒඩබ්ලිව් සමිතියට එරෙහිව යමින් සිය ජීවන තත්වයන් ආරක්ෂා කරගැනීම සඳහා ආස්ථානයක් ගනිමින් සිටිති.

සාමාන්‍ය කම්කරුවෝ මෙම කමිටුව ගොඩනගා ගත්තේ යූඒඩබ්ලිව් සමිතිය ඔවුන් වැටුප් කප්පාදුවට එරෙහිව දුන් ඡන්දය යලි යලිත් ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව ය. සංගත වෙනුවෙන් වසර ගනනක් තිස්සේ සහන පිදීමෙන් සහ සහයෝගීත්වය දීමෙන් වසර ගනනාවකට පසුව මෙම කම්කරුවෝ යූඒඩබ්ලිව් සමිතිය තමන්ට එරෙහි බවත් නව සංවිධානයක් අවශ්‍ය බවත් නිගමනය කලහ. කම්හලේ කම්කරුවන් බෙදීමට සහ දුර්වල කිරීමට එරෙහිව කමිටුව සෑම අංශයක ම-තරුන සහ මහලු, ස්ථිර සහ තාවකාලික යනා දී-කම්කරුවන් වැටුප් කප්පාදුවට සහ කම්හල වසාදැමීමට එරෙහිව එක්සත් කිරීමට සටන් කරමින් සිටී.

මහා අවපාතයෙන් මෙපිට පෙර නුවූ විරූ පරිමානයකින් දරිද්‍රතාවේ සහ සූරාකෑමේ කොන්දේසි පැනවීමට මහා ව්‍යාපාරිකය සහ එහි දේශපාලන පක්ෂවල උත්සාහයන්ට එරෙහි කම්කරුවන්ගේ එලැඹෙන ප්‍රතිප්‍රහාරය සම්බන්ධව ගත්කල මෙම කමිටුව පිහිටුවීම සැතපුම් කනුවකි.

ඉන්දියානාපොලිස් වැටුප් කප්පාදුව සඳහා වන ධාවනය මෝටර් රථ කම්කරුවන්ට එරෙහි ලෝක පරිමාන ප්‍රහාරයක කොටසකි. මේ වසර මුල දී ජීඑම්හි සහායක ඔපෙල් සමාගම බෙල්ජියමේ ඇන්ට්වර්ප්හි කම්හල වසා දැමීම නියෝජනය කලේ රැකියා 2,600ක් විනාශ කරමිනි. යුරෝපය පුරා ජීඑම් සහ අනෙකුත් මෝටර් රථ සමාගම් රැකියා කප්පාදු සහ මෝටර් රථ කම්කරුවන්ගේ ජීවන තත්වයන් හා වැඩ කොන්දේසි ආපසු හැරවීම ඉල්ලා සිටිති.

සිය එක්සත් ජනපද සගයන් මෙන් යුරෝපය සහ ලෝකය පුරා වෘත්තීය සමිති නිලධාරීහු ගෝලීය ආර්ථික අර්බුදයේ බරට කම්කරුවන් කරගැසිය යුතු ය යන ආන්ඩුවල උත්සාහයන්ට සහයෝගී වී සිටිති.

ජීඑම් මුද්‍රා අංශ කම්කරුවන්ගේ ක්‍රියාකාරී කමිටුවේ නවතම ප්‍රකාශය නිර්භීත ලෙස මෙසේ ප්‍රකාශ කරයි: "දැන් එලැඹ ඇත්තේ අප පෙරලා සටන්වැදිය යුතු කාලය යි. දීර්ඝ කාලයක් පුරා සමාගම් ඔවුන්ට අවශ්‍ය දෙය ලබාගැනීමට හැකියාව ලබාගත්හ. දීර්ඝ කාලයක් පුරා අපි ආපසු දී ඇත්තෙමු. දීර්ඝ කාලයක් පුරා සංගත විධායකයන්ගේ සහ වෝල් වීදියේ ආයෝජකයන්ගේ ආඥාවන් පිලිගැනීම සඳහා අපව රැවටීමට අපි යූඒඩබ්ලිව් සමිතියට ඉඩ දී ඇත්තෙමු. රට පුරා කම්කරුවන් අප දෙස බලා සිටින අතර අපි අපව උදාහරනයට ගන්නා ආකාරයට නායකත්වය දිය යුතු ය!"

පසුගිය සතියේ නිකුත් කරන ලද ප්‍රකාශයක කමිටුව මෙසේ නිවේදනය කලේ ය: "මෝටර් රථ කම්කරුවන්ගේ ඊ ලඟ පරම්පරාව දරිද්‍රතාවෙන් ජීවත් නො වීමේ අයිතිය දරන අතර අපි එම අයිතිය ආරක්ෂා කරන්නෙමු. කිසිදු ආකාරයක තර්ජනයන්ගෙන් අපව නවතාලිය නො හැක. යූඒඩබ්ලිව් සමිතිය විසින් ප්‍රචාරය කරනු ලබන ආර්ථික ජාතිකවාදයට එරෙහිව කමිටුව ලොව පුරා සිටින සියලු මෝටර් රථ සහ අනෙකුත් කම්කරුවන්ගේ සහයෝගය ඉල්ලා සිටී. එක්සත් ජනපදයේ සමහර ප්‍රාන්ත මෙන් ම ජපානයෙන් සහ ශ්‍රී ලංකාවෙන් දැනට ම ලිපි ලැබී තිබේ. ඔවුන්ගේ සටන ශක්තිමත් කිරීමට ද ඔවුන්ට සෑම රටක ම කම්කරුවන් අතර ඇති සහයෝගය ප්‍රදර්ශනය කිරීමට ද මෙම ක්‍රියාකාරී කමිටුව වෙත සහයෝගයේ සහ දිරිමත් කිරීමේ ලිපි යවන ලෙස අපි අපගේ පාඨකයන්ගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ ලිපි කරුනාකර indygmworkers@gmail.com වෙත යොමුකර පිටපත් eb@wsws.org වෙත එවන්න.

© www.wsws.org